17962



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ශ්‍රී ලංකා ඉතිහාසය I (I කොටස)
இலங்கை வரலாறு I (பகுதி I)
History of Sri Lanka I (Part I)

25 S I

2019.08.26 / 1300 - 1610

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

ශ්‍රී ලංකා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා

විභාග අංකය: ...................................

**උපදෙස්:**

* මෙම කොටස ප්‍රශ්න **40** කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
* **මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.**
* කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස**, **II කොටසේ** පිළිතුරු පත්‍ර සමග **අමුණා භාර දෙන්න.**

## I කොටස

● අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග **නො ගැළපේ.** එම **නො ගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

**1.** (1) උරුවෙල (2) පල්ලෙමලල (3) පතිරාජවෙල (4) මිනිහාගල්කන්ද (5) බෙල්ලන්බැඳිපැලැස්ස (.........)

**2.** (1) මහාතිත්ථ (2) ගෝකණ්ණතිත්ථ (3) සූකරතිත්ථ (4) කච්ඡකතිත්ථ (5) කාලතිත්ථ (.........)

**3.** (1) වංසත්ථප්පකාසිනී (2) සමන්තපාසාදිකා (3) මනෝරථපූරණී (4) සම්මෝහවිනෝදනී (5) සුමංගලවිලාසිනී (.........)

**4.** (1) උපෝසථඝර (2) ජන්තාඝර (3) ප්‍රතිමාඝර (4) බෝධිඝර (5) සූතිඝර (.........)

**5.** (1) සීලප්පදිකාරම් (2) ආර්පාක්කම් (3) මණිමේකලයි (4) පදිර්රුපත්තු (5) පට්ටිනප්පාලෙයි (.........)

**6.** (1) පරරාජශේකරම් (2) සංකිළි (3) පුවිරාජ පණ්ඩාරම් (4) එදිරිමාන්න සිංහම් (5) මයිල්වාගනම් (.........)

**7.** (1) අෆොන්සු (2) අල්මේදා (3) රිබේයි (4) සිල්වා (5) ප්‍රනාන්දු (.........)

[දෙවැනි පිටුව බලන්න.

**8.** (1) ජේම්ස් කෝඩිනර් (2) ජෝන් ඩේවි (3) හෙන්රි මාර්ෂල්
(4) ආර්. එල්. බ්‍රෝහියර් (5) තොමස් ස්කිනර් (.........)

**9.** (1) සයිමන් ද සිල්වා (2) වලිසිංහ හරිස්චන්ද්‍ර (3) පියදාස සිරිසේන
(4) ඩබ්. ඒ. සිල්වා (5) මාර්ටින් වික්‍රමසිංහ (.........)

**10.** (1) ඇන්ඩ්‍රෑ කෝල්ඩ්කොට් (2) හෙන්රි මන්ක් මේසන් මුවර් (3) සෝල්බරි
(4) ඔලිවර් ගුණතිලක (5) විලියම් ගොපල්ලව (.........)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නො ගැළපේ.** එම **නො ගැළපෙන** යුගලය කුමක්දැ'යි හඳුනාගෙන ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**11.**
(1) පාහියන් ලෙන - බුලත්සිංහල
(2) බටදොඹ ලෙන - කුරුවිට
(3) දොරවක ලෙන - අත්තනගල්ල
(4) බෙලි ලෙන - කිතුල්ගල
(5) අලවල ලෙන - ගම්පහ (.........)

**12.**
(1) අභයවාපි - තිසා වැව
(2) මණිහිරවාපි - මින්නේරි වැව
(3) කාණවාපි - මහකණදරා වැව
(4) පත්තපාසානවාපි - නාච්චදූව වැව
(5) ගංගාතටාකවාපි - කන්තලේ වැව (.........)

**13.**
(1) වීරශෝළියම් - දෙමළ ව්‍යාකරණ ග්‍රන්ථයකි
(2) හත්ථවනගල්ල විහාර වංසය - හත්ථිකුච්ඡි විහාරයේ වංසකථාව
(3) කඳවුරු සිරිත - දඹදෙණි යුගයේ රජවරුන්ගේ එදිනෙදා ජීවිතය පිළිබඳ විස්තරයකි
(4) සරජෝතිමාලෙයි - ජ්‍යොතිශාස්ත්‍රය පිළිබඳ දෙමළ භාෂාවෙන් රචිත ග්‍රන්ථයකි
(5) නිකාය සංග්‍රහය - ශාසන ඉතිහාසය පිළිබඳ ග්‍රන්ථයකි (.........)

**14.**
(1) ධර්මපාල - දොම් ජුවාන්
(2) යමසිංහ බණ්ඩාර - දොම් ෆිලිප්
(3) නිකපිටියේ බණ්ඩාර - දොම් මැනුවෙල්
(4) කුසුමාසන දේවී - දෝන කැතරිනා
(5) කොනප්පු බණ්ඩාර - ඔස්ට්‍රියාවේ දොම් ජුවාන් (.........)

**15.**
(1) තාරකා බලකොටුව - මාතර
(2) මැක්ඩොවල් බලකොටුව - මාතලේ
(3) මැක්ඩොනල්ඩ් බලකොටුව - බදුල්ල
(4) ෆ්‍රෙඩ්රික් බලකොටුව - ගාල්ල
(5) ඔස්ටෙන්බර්ග් බලකොටුව - ත්‍රිකුණාමලය (.........)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරවල දී ඇත. **Y** තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නො වේ. Y** තීරය, **X** තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

**16.**

| X | Y |
|---|---|
| (i) එළාර | A කිත්නුවරගල් |
| (ii) වළගම්බා | B දීඝජන්තු |
| (iii) ධාතුසේන | C චල |
| (iv) පළමුවන විජයබාහු | D මිගාර |
| (v) පළමුවන පරාක්‍රමබාහු | E කපිසීස |

(1) AECDB (2) BEDCA (3) CEBAD (4) DAECB (5) EBDAC (.........)

17.

| X | Y |
|---|---|
| (i) සාරාර්ථ සංග්‍රහය | A පස්වන කාශ්‍යප |
| (ii) ජානකීහරණය | B දෙවන පරාක්‍රමබාහු |
| (iii) දම්පියා අටුවා ගැටපදය | C හතරවන සේන |
| (iv) සියබස්ලකර | D කුමාරධාතුසේන |
| (v) කව්සිළුමිණ | E බුද්ධදාස |

(1) BACED (2) DAEBC (3) ECABD (4) EDCAB (5) EDACB (.........)

18.

| X | Y |
|---|---|
| (i) ශ්‍රේෂ්ඨාධිකරණය පිහිටුවීම | A හර්කියුලීස් රොබින්සන් |
| (ii) කොළඹ-මහනුවර මාර්ගය ඉදිකිරීම | B හෙන්රි මැකලම් |
| (iii) මහ නගර සභා පිහිටුවීම | C විලියම් මැනිං |
| (iv) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවීම | D ෆ්‍රෙඩ්රික් නෝර්ත් |
| (v) යුනිවසිටි කොලීජිය පිහිටුවීම | E එඩ්වඩ් බාන්ස් |

(1) BAECD (2) CEABD (3) CEADB (4) DEABC (5) ECDBA (.........)

19.

| X | Y |
|---|---|
| (i) ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් | A උඩරට ප්‍රදේශවල රෙසිඩන්ට්වරයා |
| (ii) ජෝන් ඩොයිලි | B විජිත ලේකම් |
| (iii) ජෝර්ජ් ටර්නර් | C පුරාවිද්‍යා කොමසාරිස් |
| (iv) එමර්සන් ටෙනන්ට් | D මධ්‍යම පළාතේ පළමුවන ඒජන්තවරයා |
| (v) එච්. සී. පී. බෙල් | E අග්‍ර විනිශ්චයකාරවරයා |

(1) ADCEB (2) DEBAC (3) EADBC (4) EBACD (5) EDACB (.........)

20.

| X | Y |
|---|---|
| (i) ඒ. එෆ්. මොලමුරේ | A ප්‍රථම සභානායක |
| (ii) ඩී. බී. ජයතිලක | B ප්‍රථම විධායක ජනාධිපති |
| (iii) ඩී. එස්. සේනානායක | C ප්‍රථම විපක්ෂ නායක |
| (iv) එන්. එම්. පෙරේරා | D ප්‍රථම අගමැති |
| (v) ජේ. ආර්. ජයවර්ධන | E ප්‍රථම කථානායක |

(1) BEACD (2) CAEDB (3) CEABD (4) EADBC (5) EADCB (.........)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නො ගැළපේ**. එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

21. **ප්‍රාග් ඓතිහාසික යුගය**

(1) ප්‍රාග් ඓතිහාසික මානවයා භාවිත කළ තාක්ෂණය මුළුමනින් ම වාගේ ශිලා මෙවලම් මත ගොඩනැගී තිබුණි.
(2) ප්‍රාග් ඓතිහාසික මානවයා ප්‍රධාන වශයෙන් දඩයමෙන් සිය ජීවිකාව සරිකර ගත්තේ ය.
(3) ප්‍රාග් ඓතිහාසික මානවයා ගින්දර නිපදවන ආකාරය දැන සිටියේ ය.
(4) ප්‍රාග් ඓතිහාසික මානවයා ස්ථාවර කෘෂිකාර්මික ජීවිතයක් ගත කළේ ය.
(5) ප්‍රාග් ඓතිහාසික මානවයා බොහෝ අවස්ථාවල දී මළ සිරුරු ගුහා තුළ මිහිදන් කළේ ය. (.........)

22. **සීගිරිය**

(1) සීගිරිය පළමුවන කාශ්‍යප රජුගේ පරිපාලන මධ්‍යස්ථානය විය.
(2) සීගිරියේ දෙවන ආලකමන්දාවක් ගොඩනැගූ පළමුවන කාශ්‍යප, කුවේරයා මෙන් එහි වාසය කළේය'යි කියනු ලැබේ.
(3) කාශ්‍යපගෙන් පසු පළමුවන මුගලන් කෙටි කලකට සීගිරිය සිය අගනගරය බවට පත්කර ගත්තේ ය.
(4) සීගිරි චිත්‍රවල එන කාන්තා රූප, විදුලිය හා වලාකුළු නිරූපණය කරති'යි මහාචාර්ය පරණවිතාන මහතා තර්ක කරයි.
(5) සීගිරි ජල උද්‍යානය පුරාණ ලංකාවේ උද්‍යාන නිර්මාණයේ සුවිශේෂී කාර්ය සිද්ධියකි. (.........)

**23.** **කුරුණෑගල යුගය**

(1) දෙවන භුවනෙකබාහු රජතුමා සිය අගනගරය කුරුණෑගලට ගෙන ආවේ ය.
(2) හතරවන පරාක්‍රමබාහු රජතුමා ක්‍රි.ව. 1302 දී සිහසුනට පත්විය.
(3) කුරුණෑගල රජ කළ වැදගත්ම පාලකයා හතරවන පරාක්‍රමබාහු ය.
(4) පන්සිය පනස් ජාතක පොත කුරුණෑගල යුගයේ දී රචනා කරන ලදී.
(5) ඇම්බැක්කේ දේවාලයේ ලී කැටයම් කුරුණෑගල යුගයට අයත් ය. (.........)

**24.** **දහඅට වන සියවසේ දෙවන භාගයේ උඩරට රාජධානියේ ඇති වූ බෞද්ධ පුනර්ජීවනය**

(1) කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අනුග්‍රහය යටතේ මෙම පුනර්ජීවනය සිදු විය.
(2) භික්ෂු උපසම්පදාව යළි පිහිටුවන ලදී.
(3) අමරපුර නිකාය ආරම්භ කරන ලදී.
(4) වැලිවිට සරණංකර හිමිපාණන් වෙත සංඝරාජ පදවිය ප්‍රදානය කරනු ලැබී ය.
(5) වාර්ෂිකව දෙවියන් වෙනුවෙන් පැවැත්වූ ඇසළ පෙරහැරට දළදා පෙරහැර හඳුන්වා දෙන ලදී. (.........)

**25.** **දහනව වන සියවසේ වතු වගාව**

(1) ජෝර්ජ් බර්ඩ් පළමුවන කෝපි වත්ත සිංහපිටියේ ආරම්භ කළේ ය.
(2) කෝපි වතු වගාවේ පරිහානියෙන් පසු සිංකෝනා වගාව හඳුන්වා දෙන ලදී.
(3) පොල් වගාව ප්‍රධාන වශයෙන් ගෙන යන ලද්දේ ස්වදේශික ධනවතුන් විසිනි.
(4) ජේම්ස් ටේලර් ලූල්කඳුරේ තේ වත්තක් ආරම්භ කළේ ය.
(5) දහනව වන සියවසේ අවසාන දශකවල දී රටේ විශාලතම අපනයන නිෂ්පාදනය වූයේ රබර් ය. (.........)

● අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති **(A), (B), (C)** සහ **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ** නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ......................................... **1** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ......................................... **2** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ......................................... **3** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ......................................... **4** ද,
**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ......... **5** ද, **වරහන තුළ** ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය. |

**26.** **පුරාණ අවධියේ ශ්‍රී ලංකාවට එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණ සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) ශ්‍රී ලංකාව පාණ්ඩ්‍ය හා චෝළ යන දෙපක්ෂයේ ම ආක්‍රමණවලට ලක් විය.
(B) එළාර පාණ්ඩ්‍ය පාලකයෙකි.
(C) චෝළ ආක්‍රමණයක ප්‍රතිඵලයක් වශයෙන් අනුරාධපුර රාජධානිය බිඳවැටුණි.
(D) මාරවර්මන් සුන්දර පාණ්ඩ්‍ය ශ්‍රී ලංකාව යටත් කරගැනීමට සමත් විය. (.........)

**27.** **පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ විදේශ සම්බන්ධතා සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) චෝළයන් සමඟ විවාහ සම්බන්ධතා
(B) චීනය සමඟ සම්බන්ධතා
(C) බුරුම ආක්‍රමණය
(D) කාම්බෝජය සමඟ මිත්‍ර සම්බන්ධතා (.........)

**28.** **උඩරට රාජධානියේ බිඳවැටීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) රජු හා මොල්ලිගොඩ මහාදිකාරම් අතර පැවැති ගැටුම
(B) රජුට ජනතා සහයෝගය අහිමි වීම
(C) බ්‍රිතාන්‍යයන්ගේ කුමන්ත්‍රණකාරී ප්‍රතිපත්තිය
(D) බ්‍රිතාන්‍යයන් විසින් මහාමාර්ග ඉදිකිරීම (………)

**29.** **බ්‍රිතාන්‍යයන් යටතේ පුරාණ වාරි කටයුතු ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) බ්‍රවුන්රිග් ඌරුබොක්ක හා කිරම වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කළේ ය.
(B) වොර්ඩ් වියළි කලාපයේ පුරාණ වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩපිළිවෙළක් ආරම්භ කළේ ය.
(C) ග්‍රෙගරි ගම් වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩපිළිවෙළක් ආරම්භ කළේ ය.
(D) ගෝර්ඩන් කලා වැව ප්‍රතිසංස්කරණය කළේ ය. (………)

**30.** **නිදහසෙන් පසු ශ්‍රී ලංකාවේ ඇති වූ ආණ්ඩුක්‍රමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) පාර්ලිමේන්තුව සමන්විත වූයේ අග්‍රාණ්ඩුකාරවරයාගෙන්, නියෝජිත මන්ත්‍රි මණ්ඩලයෙන් හා සෙනෙට් සභාවෙනි.
(B) නියෝජිත මන්ත්‍රී මණ්ඩලය මන්ත්‍රිවරුන් 101 දෙනෙකුගෙන් සමන්විත විය.
(C) සියලු ම කැබිනට් ඇමතිවරුන් නියෝජිත මන්ත්‍රි මණ්ඩලයේ සාමාජිකයින් අතුරෙන් තෝරා පත්කර ගන්නා ලදී.
(D) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සෙනෙට් සභාව අහෝසි කරන ලදී. (………)

● අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31.** **ශ්‍රී ලංකාවේ බෞද්ධ ශාසන ඉතිහාසයේ ප්‍රථම බෙදීම සිදු වූයේ කවර රජුගේ පාලන සමයේ දී ද?**
(1) සද්ධාතිස්ස (2) වළගම්බා (3) වෝහාරිකතිස්ස
(4) ගෝඨාභය (5) මහාසේන (………)

**32.** **නැව් තොටක දී අය කළ තීරු බදු පිළිබඳ ව වාර්තා වන සෙල්ලිපිය කුමක් ද?**
(1) වේවැල්කැටිය (2) හෝපිටිගමු (3) ගොඩවාය
(4) අඹගමුව (5) සංගමු විහාර (………)

**33.** **රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ප්‍රථම කාන්තා මන්ත්‍රීවරිය කවු ද?**
(1) ඇඩ්ලින් මොලමුරේ (2) මේරි රත්නම් (3) ඩොරීන් වික්‍රමසිංහ
(4) විවියන් ගුණවර්ධන (5) කුසුමා ගුණවර්ධන (………)

**34.** **ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා කවු ද?**
(1) පොන්නම්බලම් රාමනාදන් (2) පොන්නම්බලම් අරුණාචලම්
(3) මාක්ස් ප්‍රනාන්දු (4) මුත්තු කුමාරස්වාමි
(5) ජී. ජී. පොන්නම්බලම් (………)

**35.** **ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද ප්‍රථම බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය කුමක් ද?**
(1) මින්නේරිය (2) මිණිපේ (3) ගල්ඔය
(4) කලා වැව (5) පරාක්‍රම සමුද්‍රය (………)

● අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** | |
|---|---|---|---|
| **36.** | වෝහාරිකතිස්ස රජතුමා දණ්ඩනයක් වශයෙන් ශාරීරික වධහිංසා අවලංගු කිරීමට නීති පැනවී ය. | පැරණි ශ්‍රී ලංකා ආර්ථිකයේ කේන්ද්‍රීය ලක්ෂණය වූයේ වෙළෙඳාමයි. | (.........) |
| **37.** | සුභ නම් හමුදා සෙන්පතියා ජයවර්ධනපුර කෝට්ටේ බලකොටුව ගොඩනැගී ය. | ශ්‍රී ලංකාව ආක්‍රමණය කළ චීන සෙන්පති චන්ද්‍රබානු, වීර අලකේශ්වර නම් සිංහල රජු අල්ලාගෙන සිරකරුවකු ලෙස චීනයට ගෙන ගියේ ය. | (.........) |
| **38.** | පෘතුගීසීන් විසින් ආගම් ප්‍රචාරය හා අධ්‍යාපනය අතර ඇති කර තිබූ සමීප සබඳතාව ලන්දේසීන් විසින් දිගට ම පවත්වාගෙන යනු ලැබී ය. | පෘතුගීසීන් අරඹා තිබූ පාසල් තමන් වෙත පවරාගත් ලන්දේසිහු ඊට නව ජීවයක් ලබා දී ඒවායේ සංඛ්‍යාව වැඩි කොට එම පාසල් දේවස්ථානවලට සම්බන්ධ කළහ. | (.........) |
| **39.** | වලානේ සිද්ධාර්ථ හිමියෝ පරම ධම්ම චේතිය පිරිවෙන රත්මලානේ පිහිටවූහ. | හික්කඩුවේ ශ්‍රී සුමංගල හා රත්මලානේ ශ්‍රී ධර්මාලෝක යන හිමිවරුන් විසින් විද්‍යෝදය හා විද්‍යාලංකාර යන පිරිවෙන් පිහිටුවන ලදී. | (.........) |
| **40.** | ඩී. එස්. සේනානායක මහතාගේ අභාවයෙන් පසු ජෝන් කොතලාවල මහතා අගමැති තනතුරට පත්විය. | 1956 සිට 1965 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ ආණ්ඩු නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් කෙරෙහි වඩාත් යොමු විය. | (.........) |

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා ඉතිහාසය | I (II කොටස) | 25 S I |
| இலங்கை வரலாறு | I (பகுதி II) | |
| History of Sri Lanka | I (Part II) | |

**ශ්‍රී ලංකා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා**

**උපදෙස්:**

* **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **පළමුවන** ප්‍රශ්නයටත් **B** හා **C** කොටස්වලින් **එක** ප්‍රශ්නය බැගින් තෝරාගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
  (**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ශ්‍රී ලංකාවේ දළ සිතියමක්** සපයා ඇත.)

## A කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

| | | | |
|---|---|---|---|
| (i) මහාතිත්ථ | (ii) ගෝකණ්ණ | (iii) පොම්පරිප්පු | (iv) අනුරාධපුරය |
| (v) කැලණි ගඟ | (vi) මහියංගණය | (vii) පරාක්‍රම සමුද්‍රය | (viii) නල්ලූර් |
| (ix) සීතාවක | (x) ගාල්ල | (xi) මඩකලපුව | (xii) ඌව පළාත |

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි.)

## B කොටස

**2.** ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැඩගැස්වීමෙහි ලා අභ්‍යන්තර භූගෝලීය සාධක බලපෑ අයුරු පහත දැක්වෙන මාතෘකා යටතේ සාකච්ඡා කරන්න.

(i) මධ්‍යම කඳුකරය
(ii) ගංගා සහ ගංගා නිම්න
(iii) වරායන් (ලකුණු 16 යි)

**3.** "ශ්‍රී ලංකාව තුළ බුද්ධාගම පිහිටුවීම එහි සමාජයීය හා සංස්කෘතික ලක්ෂණ කෙරෙහි පමණක් නොව දේශපාලන වර්ධනය කෙරෙහි ද ඉමහත් බලපෑමක් ඇති කළේ ය."

(i) බුද්ධාගම හඳුන්වා දෙන විට ශ්‍රී ලංකාව පාලනය කළ රජතුමා නම් කරන්න. (ලකුණු 01 යි)
(ii) ශ්‍රී ලංකාවට භික්ෂු-භික්ෂුණී ශාසන හඳුන්වා දුන් තෙරුන් වහන්සේ සහ තෙරණින් වහන්සේ නම් කරන්න. (ලකුණු 02 යි)
(iii) ශ්‍රී ලංකාව තුළ බුද්ධාගම පැතිරී යාමට තුඩු දුන් සාධක සැකෙවින් දක්වන්න. (ලකුණු 03 යි)
(iv) අනුරාධපුර යුගයේ අවසානය තෙක් බුද්ධාගම ශ්‍රී ලංකාවේ සමාජය, සංස්කෘතිය හා දේශපාලනය සම්බන්ධයෙන් ඉමහත් බලපෑමක් ඇති කළ අයුරු විග්‍රහ කරන්න. (ලකුණු 10 යි)

**4.** "පළමුවන විජයබාහු රජතුමා ලංකා ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ පාලකයකු ලෙස සැලකෙන්නේ බොහෝ බාධක මධ්‍යයේ ඔහු විදේශාධිපත්‍යයෙන් රට මුදවාගෙන එක්සේසත් කළ බැවිනි." සාකච්ඡා කරන්න. (ලකුණු 16 යි)

**5.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) අනුරාධපුර යුගයේ වාරිමාර්ග ක්‍රමය
(ii) රජරට ශිෂ්ටාචාරයේ බිඳවැටීමට තුඩු දුන් සාධක
(iii) යාපනය රාජධානියේ ආරම්භය හා වර්ධනය
(iv) කෝට්ටේ යුගයේ සංස්කෘතික වර්ධනය (එක් කෙටි සටහනකට ලකුණු 08 බැගිනි.)

අවවැනි පිටුව බලන්න.

මෙතැනින් කපන්න

## C කොටස

6. "උඩරට පාලකයෝ මුහුදුබඩ පළාත් පාලනය කළ පෘතුගීසීන්ට විරුද්ධ ප්‍රතිපත්තියක් අනුගමනය කළහ."

(i) උඩරට රාජධානියේ ආරම්භක පාලකයා ලෙස සැලකෙන්නේ කවු ද? (ලකුණු 01 යි)

(ii) පෘතුගීසීන් යටතේ රැකවරණය ලැබූ උඩරට පාලකයා සහ ඔහුගේ දියණිය නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) උඩරට රාජධානිය ආක්‍රමණය කිරීමට පෘතුගීසීන් පෙළඹ වූ සාධක සැකෙවින් දක්වන්න. (ලකුණු 03 යි)

(iv) පෘතුගීසීන්ට එරෙහිව උඩරට පාලකයන් අනුගමනය කළ ප්‍රතිපත්තිය විචාරාත්මක ව විමසන්න. (ලකුණු 10 යි)

7. කෝල්බෲක්-කැමරන් කොමිසම විසින් යෝජනා කරන ලද ආණ්ඩුක්‍රම, පරිපාලන හා අධිකරණ ප්‍රතිසංස්කරණවල වැදගත්කම පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

8. 1948 සිට 1978 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ ඇති වූ ආර්ථික සංවර්ධනය පහත දැක්වෙන මාතෘකා යටතේ පරීක්ෂා කරන්න.

(i) වී ගොවිතැන හා ගොවි ජනපද ව්‍යාපාරය

(ii) ජනසතු ව්‍යාපාරය

(iii) කර්මාන්ත (ලකුණු 16 යි)

9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) මුහුදුබඩ පළාත්වල ලන්දේසි පරිපාලන ක්‍රමය

(ii) 1848 බ්‍රිතාන්‍ය විරෝධී අරගලය

(iii) දහනව වන සියවසේ දෙවන භාගයේ ඇති වූ හින්දු හා ඉස්ලාම් සංස්කෘතික ප්‍රබෝධය

(iv) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය

(එක් කෙටි සටහනකට ලකුණු 08 බැගින්)

* * *

AL/2019/25/S-I(NEW)

17962

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

NEW


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා ඉතිහාසය I<br>இலங்கை வரலாறு I<br>History of Sri Lanka I | 25 | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. } 1

විභාග අංකය / சுட்டெண் / Index No. } ..............................



15560

AL/2019/25 A/S-II(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ඉන්දීය ඉතිහාසය II (I කොටස)
இந்திய வரலாறு II (பகுதி I)
History of India II (Part I)

25 A S II

2019.08.23 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

ඉන්දීය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා

විභාග අංකය: ...................................

උපදෙස්:
- ✳ මෙම කොටස ප්‍රශ්න **40** කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- ✳ එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
- ✳ මෙම කොටසට ලකුණු **40** ක් දෙනු ලැබේ.
- ✳ කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස, II කොටසේ** පිළිතුරු පත්‍ර සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

- අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැළපේ.** එම **නො ගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

1. (1) හෙරඩෝටස් (2) ප්ලිනි (3) මෙගස්තිනිස්
   (4) ජස්ටින් (5) ස්ට්‍රාබෝ (......)

2. (1) භාරුකච්ඡ (2) සුප්පාරක (3) තාම්‍රලිප්ති
   (4) දේවගිරි (5) කාවේරිපට්ටිනම් (......)

3. (1) නර්මදා (2) කෘෂ්ණා (3) තුංගභද්‍රා
   (4) මහානදී (5) ගෝදාවරී (......)

4. (1) උජ්ජේනි (2) සුවර්ණගිරි (3) තක්ෂිලා
   (4) කාලිංග (5) තෝසලී (......)

5. (1) මේඝදූතය (2) කුමාරසම්භව (3) මුද්‍රාරාක්ෂස
   (4) මාලවිකාග්නිමිත්‍ර (5) ඍතුසංහාර (......)

6. (1) භාග් (2) උදයගිරි (3) අජන්තා
   (4) එල්ලෝරා (5) අවුරංගබාද් (......)

7. (1) නාගසේන (2) අච්‍යුත (3) රුද්‍රදේව
   (4) මතිල (5) ව්‍යාඝ්‍රරාජ (......)

8. (1) මාරවර්මන් (2) මහේන්ද්‍රවර්මන් (3) නරසිංහවර්මන්
   (4) පරමේශ්වරවර්මන් (5) නන්දිවර්මන් (......)

[දෙවැනි පිටුව බලන්න.

9. (1) මහමුද් බින් ක්වාසිම් (2) සබුක්තිජින් (3) අල්බිරූනි
(4) ගස්නි මහමුද් (5) ඝූර් මහමුද් (……)

10. (1) ගර්භගෘහ (2) විමාන (3) අන්තරාල
(4) ද්වාර මණ්ඩප (5) රථ (……)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නො ගැළපේ**. එම **නො ගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

11. (1) චම්පා - අංග
(2) තක්ෂිලා - කාම්බෝජ
(3) ඉන්ද්‍රප්‍රස්ත - කුරු
(4) මථුරා - සූරසේන
(5) බරණැස - කාසි (……)

12. (1) වංශකථා - රාජතරංගිනී
(2) නාට්‍ය - ශාකුන්තල
(3) මහා කාව්‍ය - පංචතන්ත්‍රය
(4) කාව්‍ය - රඝුවංශය
(5) ශබ්දකෝෂ - අමරකෝෂ (……)

13. (1) රාෂ්ට්‍රකූට - පළමුවන නාගභට
(2) වලභි - දෙවන ධ්‍රැවසේන
(3) මෞඛරී - ග්‍රහවර්මන්
(4) පුෂ්‍යභූති - ප්‍රභාකරවර්ධන
(5) ගෞඩ - සසංක (……)

14. (1) රූපාර් - සත්ලෙජ්
(2) ඉන්ද්‍රප්‍රස්ථ - යමුනා
(3) හරප්පා - රාවි
(4) භාරුකච්ඡ - නර්මදා
(5) වරංගල් - මහානදී (……)

15. (1) චරක - කුෂාණ
(2) පතංජලි - සුංග
(3) දණ්ඩින් - පල්ලව
(4) බිල්හන - සාතවාහන
(5) විශාඛදත්ත - ගුප්ත (……)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරවල දී ඇත. **Y** තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නො වේ**. **Y** තීරය **X** තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

16.

| | X | | Y |
|---|---|---|---|
| (i) | පරමේශ්වර | A | පළමුවන රාජරාජ |
| (ii) | මදුරෙයිකොණ්ඩ | B | හර්ෂවර්ධන |
| (iii) | මුම්මුඩි චෝළදේව | C | දෙවන පුලිකේෂින් |
| (iv) | වාතාපිකොණ්ඩ | D | පළමුවන පරන්තක |
| (v) | සකල උත්තරාපථනාථ | E | පළමුවන නරසිංහවර්මන් |

(1) ADCBE (2) CADEB (3) CDAEB (4) DCAEB (5) EDBAC
(……)

**17.**

| X | Y |
|---|---|
| (i) කාන්ව | A ප්‍රතිෂ්ඨාන් |
| (ii) සාතවාහන | B තංජෝර් |
| (iii) චෝළ | C මදුරෙයි |
| (iv) පල්ලව | D පාටලීපුත්‍ර |
| (v) පාණ්ඩ්‍ය | E කාංචි |

(1) ABDEC (2) BADCE (3) CADEB (4) DABEC (5) DBAEC (......)

**18.**

| X | Y |
|---|---|
| (i) කෝසල දේවී | A ප්‍රසේනජිත් |
| (ii) මල්ලිකා දේවී | B බිම්බිසාර |
| (iii) විදිසා දේවී | C ග්‍රහවර්මන් |
| (iv) රාජශ්‍රී | D අජාසත්ත |
| (v) වජිරා | E අසෝක |

(1) ABECD (2) BAECD (3) BAEDC (4) CABED (5) DAEBC (......)

**19.**

| X | Y |
|---|---|
| (i) අයිහෝලේ | A ගෞතමී බාලශ්‍රී |
| (ii) භිටරි | B කණිෂ්ක |
| (iii) හරීගුම්පා | C ස්කන්ධගුප්ත |
| (iv) සාරානාත් | D ඛාරවේල |
| (v) නාසික් | E දෙවන පුලකේෂින් |

(1) CEDBA (2) DCABE (3) DECAB (4) EDCBA (5) ECDBA (......)

**20.**

| X | Y |
|---|---|
| (i) කඩුන්ගෝන් | A පල්ලව |
| (ii) විජයාලය | B සාතවාහන |
| (iii) සිංහවිෂ්ණු | C පාණ්ඩ්‍ය |
| (iv) දන්තිදුර්ග | D චෝළ |
| (v) සිමුක | E රාෂ්ට්‍රකූට |

(1) ACDEB (2) CADEB (3) CDAEB (4) DCEBA (5) DECAB (......)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නො ගැළපේ**. එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21. ඉන්දු නිම්න නගර සැලසුම්**

(1) නගර සැලසුම්කරණය හා සනීපාරක්ෂාව ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ කැපී පෙනෙන ලක්ෂණ වේ.
(2) වීථි හා පටු මාවත් සැලසුමකට අනුව ඉදිකොට ඇත.
(3) මොහෙන්ජොදාරෝ සහ හරප්පා නගරවල ගොඩනැගිලි ඉදිකොට ඇත්තේ පාෂාණවලිනි.
(4) වීථි හා පටු මාවත් අඩි 9 සිට 34 දක්වා පළලින් යුක්ත ය.
(5) වැදගත් ඉන්දුනිම්න නගර බලකොටුව සහ පහළ නගරය යන කොටස් දෙකකින් සමන්විත විය. (......)

**22. අසෝක සෙල්ලිපි**

(1) ග්‍රීක, ඇරමයික් හා ප්‍රාකෘත භාෂාවලින් අසෝක සෙල්ලිපි ලියා ඇත.
(2) අසෝකගේ සමහර සෙල්ලිපි පර්ෂියානු දේශයෙන් ද ලැබී ඇත.
(3) මෙම සෙල්ලිපි ලියා ඇත්තේ ඇරමයික්, ග්‍රීක, ඛරෝෂ්ඨී හා බ්‍රාහ්මී අක්ෂර වලිනි.
(4) ඛරෝෂ්ඨී අක්ෂර දකුණේ සිට වමටද බ්‍රාහ්මී අක්ෂර වමේ සිට දකුණට ද ලියා ඇත.
(5) කන්දහාර් ප්‍රදේශයෙන් ලැබුණු සෙල්ලිපියක් ග්‍රීක හා ඇරමයික් යන භාෂා දෙකෙන්ම ලියා ඇත. (......)

**23. ගන්ධාර කලාව**

(1) බුද්ධ ප්‍රතිමාව මනුෂ්‍ය ස්වරූපයෙන් ගලින් නිර්මාණය කොට ඇත.
(2) ගන්ධාර කලාවට පෙර බුදුන් වහන්සේ දක්වන ලද්දේ ශ්‍රීපා සටහන, බෝගස, ඡත්‍රය සහ ධර්මචක්‍රය වැනි සංකේත වලිනි.
(3) ගන්ධාර සම්ප්‍රදායේ බොහෝ නිර්මාණ ලැබී ඇත්තේ පුරුෂපුරය හා තදාසන්න ප්‍රදේශයෙනි.
(4) ගන්ධාර කලා නිර්මාණ මථුරා හා අමරාවතී කලා සම්ප්‍රදායන්ගෙන් බොහෝ ආභාසය ලැබූ බවට විශ්වාස කෙරේ.
(5) මෙම කලා සම්ප්‍රදාය "ග්‍රීක - බෞද්ධ" නැතහොත් "ඉන්දු-ග්‍රීක" කලාව ලෙස ද හඳුන්වනු ලැබේ. (......)

**24. ගුප්ත අධිරාජ්‍ය බිඳවැටීම**

(1) ගුප්ත අධිරාජ්‍යයේ පිරිහීම ආරම්භ වූයේ ක්‍රි.ව. පස්වන සියවසේ අගදී ය.
(2) ගුප්ත අධිරාජ්‍ය බිඳවැටීමට මුල් වූ ප්‍රධාන සාධකය වූයේ හූන ආක්‍රමණයි.
(3) අභ්‍යන්තර අර්බුද ප්‍රාන්ත පාලකයන්ට ස්වාධීනව ක්‍රියා කිරීමට මඟ පෑදී ය.
(4) ගුප්තයන්ගේ බිඳවැටීමත් සමඟ අගනුවර ලෙස පාටලීපුත්‍රයේ පැවති වැදගත්කම නැති වී ගියේ ය.
(5) ගුප්ත අධිරාජ්‍ය බිඳවැටීමේ සිට මුස්ලිම්වරුන්ගේ පැමිණීම දක්වා කාලය තුළ කිසිම රජකෙනකු උතුරු ඉන්දියාව එක්සත් කිරීමට සමත් නොවී ය. (......)

**25. දකුණු ඉන්දියාව**

(1) දකුණු ඉන්දියානු ප්‍රදේශ යටත්කොට තම රාජ්‍යයට ඈඳා ගැනීමට සමත්වූ එක ම උතුරේ රජු හර්ෂවර්ධනයි.
(2) වින්ධ්‍යා කඳුවැටියෙන් දකුණු ප්‍රදේශය දකුණු ඉන්දියාව ලෙසට සැළකේ.
(3) කෘෂ්ණ - තුංගභද්‍රා නදීවලින් උතුරු ප්‍රදේශය ඩෙකානය ලෙස හැඳින්වේ.
(4) ක්‍රි.ව. අටවැනි සියවස මැද සිට ඩෙකානයේ විශාල ප්‍රදේශයක් පළමුව රාෂ්ට්‍රකූටයන් විසින් ද අනතුරුව චාලුක්‍යයන් විසින් ද පාලනය කරන ලදී.
(5) පල්ලව, පාණ්ඩ්‍ය හා චෝළ පාලකයෝ රාෂ්ට්‍රකූට හා චාලුක්‍යය පාලකයන්ගේ සමකාලීනයෝ වූහ. (......)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A)**, **(B)**, **(C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක්** හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් .............................................. **1** ද
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් .............................................. **2** ද
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් .............................................. **3** ද
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් .............................................. **4** ද
වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් .............. **5** ද **වරහන තුළ** ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය. |

**26. මහාභාරතය**

(A) ව්‍යාස මහාභාරතයේ කර්තෘ ලෙස සැලකේ.
(B) මෙම වීරකාව්‍යය කෞරවයන් සහ පාණ්ඩවයන් අතර ඇති වූ යුද්ධය පිළිබඳ ව ලියැවී ඇත.
(C) යුද්ධය අවසන් වූයේ කුරුක්ෂේත්‍රයෙහි සිදු වූ සටනින් යුධිෂ්ඨිර ජය ගැනීමෙනි.
(D) ක්‍රි.ව. හයවන සියවසේ දී පවා පාණ්ඩවයන් බලවත් ගෝත්‍රයක් විය. (......)

**27. ඍග්වෛදික ජනයා**

(A) කාබුල් සිට ගංගානම් ගංගා නිම්නය දක්වා වූ ප්‍රදේශය ඍග් වෛදික ජනයා දැන සිටියහ.
(B) වින්ධ්‍යා කඳුවැටියට දකුණෙන් පිහිටි ප්‍රදේශය ඔවුහු දැන සිටියහ.
(C) මුහුද පිළිබඳ ව ඔවුහු දැන නොසිටියහ.
(D) ඍග්වෛදික ජනයාගේ ප්‍රධාන ආහාරය වූයේ බත් ය. (......)

[පස්වැනි පිටුව බලන්න.

**28. පාණ්ඩ්‍යයෝ**

(A) ඉන්දියානු අර්ධද්වීපයේ දකුණු කෙළවරෙහි නැගෙනහිර වෙරළබඩ ප්‍රදේශය පාණ්ඩ්‍ය පාලකයන් යටතේ පාලනය විය.
(B) ශ්‍රී මාර ශ්‍රී වල්ලභ නම් වූ පාණ්ඩ්‍ය පාලකයා විසින් ශ්‍රී ලංකාවේ රජු මෙන් ම පල්ලව, ගංග සහ චෝළ ඒකාබද්ධ හමුදාවක්ද පරාජයට පත් කරන ලදී.
(C) පළමුවන රාජරාජ විසින් පල්ලව රාජධානිය චෝළ අධිරාජ්‍යයට ඈඳා ගැනීමත් සමඟ පාණ්ඩ්‍ය රාජ්‍යය අවසන් විය.
(D) පාණ්ඩ්‍ය පාලකයෝ හින්දු ආගමේ ආධාරකරුවෝ වුව ද ඔවුන්ගේ අනුග්‍රහය යටතේ බුද්ධාගම සමෘද්ධිමත්ව පැවතුණි. (……)

**29. පල්ලවයෝ**

(A) සාතවාහනයන්ගේ වැටීමෙන් පසු පල්ලවයෝ ඩෙකානයේ බලයට පැමිණියහ.
(B) පල්ලවයන් හා චාලුක්‍යයන් අතර ගැටුම් ආරම්භ වූයේ පළමුවන මහේන්ද්‍රවර්මන් රජ සමයේ දී ය.
(C) පළමුවන නරසිංහවර්මන්ගේ හමුදාවලට චාලුක්‍ය පාලක දෙවන පුලකේෂින් පරාජය කොට මරාදැමීමට හැකි විය.
(D) දෙවන පුලකේෂියන්ගේ මරණින් අනතුරුව චාලුක්‍ය අගනුවර වූ වාතාපිය පල්ලව රාජධානියේ ප්‍රාදේශීය පරිපාලන මධ්‍යස්ථානයක් බවට පත් විය. (……)

**30. හර්ෂවර්ධන**

(A) ගුප්තයන්ගෙන් පසු උතුරු හා දකුණු ඉන්දියාව එක්සත් කිරීමට හර්ෂවර්ධන සමත්විය.
(B) හර්ෂවර්ධන ගෞඩ රජපවුල සමඟ විවාහ සබඳතාවකට පැමිණියේ ය.
(C) හර්ෂවර්ධන පළමුව ථානේශ්වරයේ සිහසුනට පත් වූ අතර නීත්‍යානුකූල උරුමකරුවකු නොසිටි බැවින් කනෞජයේ සිහසුන භාර ගැනීමටද ඔහුට ආරාධනා කෙරිණ.
(D) හර්ෂවර්ධන විසින් තම අගනුවර ථානේශ්වරයේ සිට කනෞජයට මාරු කරන ලදී (……)

- අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31.** පාටලීපුත්‍ර නගරය පිහිටුවන ලද්දේ කවුරුන් විසින් ද?

(1) බිම්බිසාර (2) උදායින් (3) මහාපද්ම නන්ද
(4) චන්ද්‍රගුප්ත මෞර්ය (5) පුෂ්‍යමිත්‍ර සුංග (……)

**32.** ටොලමි පිලඩෙල්පස් නම් ඊජිප්තු රජු විසින් මෞර්ය රාජ්‍ය සභාවට එවන ලද තානාපතිවරයා කවරෙක් ද?

(1) ඩයිමාකෝස් (2) මෙගස්තීනිස් (3) ඩියෝඩරස්
(4) ඩියෝනිසිස් (5) ඇන්ටියෝකස් (……)

**33.** නාලන්දා බෞද්ධ භික්ෂු ආශ්‍රමය පිහිට වූ බවට විශ්වාස කරනු ලබන්නේ කුමන රජු ද?

(1) පළමුවන කුමාරගුප්ත (2) ගෝපාල (3) දේවපාල
(4) ධර්මපාල (5) විෂ්ණුගුප්ත (……)

**34.** සෝමනාත් දේවාලය කැප කරන ලද්දේ කුමන දෙවියන්ට ද?

(1) විෂ්ණු (2) ශිව (3) සූර්ය
(4) ක්‍රිෂ්ණ (5) අග්නි (……)

**35.** චෝළ අධිරාජ්‍යය බෙදා තිබුණු මණ්ඩල ගණන කොපමණ ද?

(1) හයකි. (2) හතකි. (3) අටකි.
(4) දොළහකි. (5) දාහතරකි. (……)

● අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ **දෙක** බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා, ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** | |
|---|---|---|---|
| **36.** | අංගුත්තර නිකායේ දැක්වෙන ආකාරයට ක්‍රි.පූ. හයවැනි සියවසේ ඉන්දියාවේ මහාජනපද දහසයක් පැවතිණි. | ශාක්‍ය, භග්ග, බූලි, කාලාම, කෝලිය, මෝරිය, විදේහ සහ ලිච්ඡවි යන සණ රාජ්‍ය එම මහාජනපද දහසයට අයත් විය. | (......) |
| **37.** | අන්තිම ජෛන තීර්ථංකර වූ මහාවීර, බිම්බිසාර රජුගේ සමකාලීනයෙකි. | ජෛන තීර්ථංකරයන්ගේ ධර්මය ක්‍රි.ව. පස්වැනි සියවසේ දී වල්ලබායිහිදී ලේඛනගත කරන ලදී. | (......) |
| **38.** | මෙගස්තිනිස් වනාහි මෞර්ය රාජ්‍ය සභාවේ සිටි මහා ඇලෙක්සැන්ඩර්ගේ තානාපතිවරයා ය. | පාටලීපුත්‍ර නගරයේ පාලනය කොමසාරිස් මණ්ඩල හයක් විසින් සිදු කරන ලද බව මෙගස්තිනිස් වාර්තා කරයි. | (......) |
| **39.** | පාණ්ඩ්‍යයන් තම රාජ්‍ය දකුණු සීමාවේ සිටි නිදහස් ජනතාවක් බව අසෝක, සෙල්ලිපිවල විස්තර කෙරේ. | පාණ්ඩ්‍ය රාජ්‍ය තානාපති කණ්ඩායමක් රෝම අධිරාජ ඔගස්ටස් සීසර් වෙත යැවූ බව ස්ට්‍රාබෝ පවසයි. | (......) |
| **40.** | අලහබාද් ස්තම්භ ලිපියේ සමුද්‍රගුප්ත රජුගේ යුද ජයග්‍රහණ දක්වන්නේ ඒවා සිදු වූ කාලානුපිළිවෙළ අනුව ය. | දකුණේ රජවරුන් පරාජය කළ සමුද්‍රගුප්ත අනතුරුව ඔවුනට ගුප්ත ආධිපත්‍යය යටතේ පාලනය කිරීමට ඉඩ දුන්නේ ය. | (......) |

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ඉන්දීය ඉතිහාසය II (II කොටස)
இந்திய வரலாறு II (பகுதி II)
History of India II (Part II)

25 A S II

ඉන්දීය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා

**උපදෙස්:**

* **පළමුවැනි** ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නයටත්, **B** හා **C** කොටස්වලින් එක ප්‍රශ්නය බැගින් තෝරා ගෙන තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.

(**පළමුවැනි** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ඉන්දියාවේ දළ සිතියමක්** සපයා ඇත.)

## A කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

| | | | |
|---|---|---|---|
| (i) | හරප්පා | (ii) | වින්ධ්‍යා කඳුවැටිය |
| (iii) | තක්ෂිලා | (iv) | සුප්පාරක |
| (v) | බැරෝඩා කපොල්ල | (vi) | යමුනා ගඟ |
| (vii) | කාංචි | (viii) | කාලිංග |
| (ix) | අයිහෝලේ | (x) | ප්‍රයාග |
| (xi) | තාම්‍රලිප්ති | (xii) | උජ්ජේනි |

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි.)*

## B කොටස

**2.** ඉන්දු නිම්න වැසියන්ගේ සමාජ, ආර්ථික හා සංස්කෘතික තත්ත්වය පරීක්ෂා කරන්න. *(ලකුණු 16යි.)*

**3.** "පශ්චාත් වෛදික යුගය සංක්‍රාන්ති සමයකි."

(i) පශ්චාත් වෛදික යුගයේ ජනාවාස ප්‍රධාන වශයෙන් පිහිටා තිබුණේ කුමන ගංගාව ආශ්‍රිතව ද? *(ලකුණු 01යි.)*

(ii) පශ්චාත් වෛදික යුගය පිළිබඳ තොරතුරු ලබා ගැනීමට උපයෝගී කරගත හැකි මූලාශ්‍ර **දෙකක්** නම් කරන්න. *(ලකුණු 02යි.)*

(iii) පශ්චාත් වෛදික යුගයේ සමාජයෙහි ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න. *(ලකුණු 04යි.)*

(iv) ඍග් වෛදික යුගයේ දේශපාලන හා සංස්කෘතික තත්ත්වයන් පශ්චාත් වෛදික යුගයේ දී වෙනස් වී ඇති ආකාරය පරීක්ෂා කරන්න. *(ලකුණු 09යි.)*

**4.** "අශෝක ධර්ම ප්‍රතිපත්තිය මුළුමනින්ම බුදු දහමින් ආභාසය ලබා ඇත." මෙම ප්‍රකාශය විචාරාත්මකව පරීක්ෂා කරන්න *(ලකුණු 16යි.)*

**5.** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් **දෙකක** ඓතිහාසික වැදගත්කම පරීක්ෂා කරන්න.

(i) වයඹදිග කපොලු

(ii) ක්‍රි.පූ. හයවැනි සියවසේ පැවති සමූහාණ්ඩු

(iii) නන්ද රාජවංශය

(iv) අර්ථ ශාස්ත්‍රය

*(එක් කොටසකට ලකුණු 08 බැගිනි.)*

## C කොටස

**6.** මෞර්ය අධිරාජ්‍යය බිඳ වැටීමෙන් අනතුරුව ගුප්ත අධිරාජ්‍යය බිහිවීම දක්වා වූ කාලය තුළ වයඹ දිග ඉන්දියාවේ දේශපාලන හා සංස්කෘතික ක්ෂේත්‍රයන්හි විවිධ විදේශීය ආක්‍රමණික කණ්ඩායම්වල දායකත්වය පරීක්ෂා කරන්න. *(ලකුණු 16යි.)*

[අටවැනි පිටුව බලන්න.

මෙතැනින් කපන්න

**7.** "ගුප්ත අධිරාජ්‍ය බලය උච්චස්ථානයට පැමිණියේ දෙවන චන්ද්‍රගුප්ත රජු සමයේ දී ය."

(i) දෙවන චන්ද්‍රගුප්ත රජු සමයේ ඉන්දියාවට පැමිණි සුප්‍රකට චීන දේශාටක භික්ෂූන් වහන්සේ නම් කරන්න. (ලකුණු 01යි.)

(ii) දෙවන චන්ද්‍රගුප්ත රජු භාවිත කළ විරුදනාම **දෙකක්** නම් කරන්න. (ලකුණු 02යි.)

(iii) ස්වකීය දේශපාලන බලය ව්‍යාප්ත කිරීම සඳහා දෙවන චන්ද්‍රගුප්ත රජු විසින් පවත්වන ලද විවාහ සම්බන්ධතා පිළිබඳ සැකෙවින් දක්වන්න. (ලකුණු 03යි.)

(iv) අධිරාජ්‍ය ව්‍යාප්තිය සඳහා දෙවන චන්ද්‍රගුප්ත රජු අනුගමනය කළ ක්‍රියා මාර්ග පරීක්ෂා කරන්න. (ලකුණු 10යි.)

**8.** පාල රාජ වංශයේ වැදගත්කම පහත දැක්වෙන මාතෘකා යටතේ පැහැදිලි කරන්න.

(i) බෙංගාලයේ රාජ්‍යයක් පිහිටුවීම සහ එහි ව්‍යාප්තිය

(ii) පාල වංශිකයන් යටතේ සිදු වූ ආගමික හා සංස්කෘතික වර්ධනය (ලකුණු 16යි.)

**9.** පහත දැක්වෙන මාතෘකාවලින් **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටිසටහන් ලියන්න.

(i) අලහබාද් ප්‍රශස්තිය

(ii) දෙවන පුලකේෂින් යටතේ චාලුක්‍ය බල වර්ධනය

(iii) පළමුවන රාජේන්ද්‍ර යටතේ සිදු වූ චෝළ බල ව්‍යාප්තිය

(iv) අරාබි සහ තුර්කි ආක්‍රමණ

(ලකුණු 08 × 2 = 16යි.)

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ඉන්දීය ඉතිහාසය II
இந்திய வரலாறு II
History of India II

25A S

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 1

විභාග අංකය / சுட்டெண் / Index No. ...................................



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

යුරෝපා ඉතිහාසය II (I කොටස)
ஐரோப்பிய வரலாறு II (பகுதி I)
History of Europe II (Part I)

25 B | S | II

2019.08.23 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

යුරෝපා ඉතිහාසය - ග්‍රීක-රෝම අවධියේ සිට ක්‍රි.ව. 1989 දක්වා

විභාග අංකය: ....................................

**උපදෙස්:**

* මෙම කොටස ප්‍රශ්න **40** කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
* මෙම කොටසට **ලකුණු 40 ක්** දෙනු ලැබේ.
* කොටස් දෙකට ම මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස, II කොටසේ** පිළිතුරු පත්‍ර සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

● අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැළපේ.** එම **නො ගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

**1.** (1) ඇසොව් (2) ඇල්ප්ස් (3) ඇපිනයින්
(4) කොකේසස් (5) පිරනීස් (.........)

**2.** (1) සියුස් (2) ඇතීනා (3) ඇෆ්‍රොඩයිට්
(4) පොසීඩන් (5) ජුපිටර් (.........)

**3.** (1) රාජාණ්ඩුව (2) කතිපයාධිපති ආණ්ඩුව (3) පූජක තන්ත්‍රය
(4) ප්‍රජා පීඩන පාලනය (5) ප්‍රජාතන්ත්‍රවාදය (.........)

**4.** (1) සොලොන් (2) සිසරෝ (3) පිසිස්ට්‍රාටස්
(4) ක්ලීස්තිනීස් (5) පෙරික්ලීස් (.........)

**5.** (1) තේලීස් (2) පයිතගරස් (3) ඩිමොක්‍රිටස්
(4) ඩයනීසස් (5) ආකිමිඩීස් (.........)

**6.** (1) පාර්ලිමේන්තුව (2) ප්‍රිවි කවුන්සලය (3) ස්ටේට්ස් ජෙනරල්
(4) රයිෂ්ටාග් (5) ඩූමා (.........)

**7.** (1) ට්‍රැෆල්ගාර් සටන (2) ඔස්ටර්ලිට්ස් සටන (3) මැජෙන්ටා සටන
(4) ජේනා සටන (5) ලිප්සිග් සටන (.........)

**8.** (1) අයිලා ෂැපෙල් (2) ට්‍රොපෝ (3) ලයිබැක්
(4) විලාෆ්‍රැන්කා (5) වෙරෝනා (.........)

9. (1) ලොයිඩ් ජෝර්ජ් (2) ක්ලෙමන්සෝ (3) වුඩ්රෝ විල්සන්
(4) ඕර්ලැන්ඩෝ (5) රූස්වෙල්ට් (.........)

10. (1) බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලය
(2) ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO)
(3) උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය (NATO)
(4) වෝර්සෝ ගිවිසුම
(5) යුරෝපා සංගමය (EU) (.........)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එක්** යුගලයක පද එකිනෙකට **නො ගැළපේ**. එම **නො ගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

11. (1) හෝමර් - ඔඩිසි
(2) සොෆොක්ලීස් - ඉඩිපස් රෙක්ස්
(3) ඇරිස්ටොෆනීස් - වලාකුළු (The Clouds)
(4) සොක්‍රටීස් - දේශපාලනය (Politics)
(5) ප්ලේටෝ - සමූහාණ්ඩුව (The Republic) (.........)

12. (1) ටොලමි - පෘථිවි කේන්ද්‍රීය න්‍යාය
(2) කොපර්නිකස් - සූර්ය කේන්ද්‍රීය න්‍යාය
(3) අයිසැක් නිව්ටන් - පරිණාමවාදී න්‍යාය
(4) මාරී කියුරි - රේඩියම් සොයා ගැනීම
(5) ඇල්බට් අයින්ස්ටයින් - සාපේක්ෂතාවාදී සිද්ධාන්තය (.........)

13. (1) වැලොයි - ප්‍රංශය
(2) බ්‍රැගන්සා - ස්පාඤ්ඤය
(3) ඔරෙන්ජ් - නෙදර්ලන්තය
(4) රොමනොෆ් - රුසියාව
(5) සැවෝයි - ඉතාලිය (.........)

14. (1) සියක් අවුරුදු යුද්ධය - ප්‍රංශය පාර්ශ්වකරුවෙකි
(2) තිස් අවුරුදු යුද්ධය - ප්‍රංශය පාර්ශ්වකරුවෙකි
(3) හත් අවුරුදු යුද්ධය - ප්‍රංශය පාර්ශ්වකරුවෙකි
(4) ක්‍රිමියන් යුද්ධය - ප්‍රංශය පාර්ශ්වකරුවෙකි
(5) සත් සති යුද්ධය - ප්‍රංශය පාර්ශ්වකරුවෙකි (.........)

15. (1) ජෝන් ලොක් - පරමාධිකාරී රාජාණ්ඩුව
(2) ජෙරමි බෙන්තම් - උපයෝගිතාවාදය
(3) වී. අයි. ලෙනින් - නිර්ධන පාන්තික ආඥාදායකත්වය
(4) ලියොන් ට්‍රොට්ස්කි - නොනවතින විප්ලවය
(5) ජෝශප් ස්ටාලින් - තනි රටේ සමාජවාදය (.........)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරුවල දී ඇත. **Y** තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නො වේ**. **Y** තීරුව, **X** තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

16.

| | X | | Y |
|---|---|---|---|
| (i) | හෙරක්ලීටස් | A | "සියලු දේ මනින මිනුම් දණ්ඩ මිනිසා ය." |
| (ii) | ප්‍රොටගරස් | B | "එක ගඟට දෙවරක් බැසිය නොහැකි ය." |
| (iii) | සොක්‍රටීස් | C | "සෑම රෝගයකට ම ස්වාභාවික හේතුවක් ඇත." |
| (iv) | හිපොක්‍රටීස් | D | "මිනිසා වූ කලී දේශපාලන සත්ත්වයෙකි." |
| (v) | ඇරිස්ටෝටල් | E | "සද්භාවය වූ කලී ඥානුමයි." |

(1) ABECD (2) AEDCB (3) BAECD (4) BEACD (5) DEABC(.........)

3454

17.

| X | Y |
|---|---|
| (i) පාර්තිනොන් | A මොස්කව් |
| (ii) කොලොසියම් | B ලන්ඩන් |
| (iii) ක්‍රෙම්ලින් | C රෝමය |
| (iv) වෙස්ට්මිනිස්ටර් මාලිගය | D පැරිස් |
| (v) නෝත්‍රු දාම් දෙව්මැදුර | E ඇතැන්ස් |

(1) DCEAB (2) DCEBA (3) DEABC (4) EACDB (5) ECABD(.........)

18.

| X | Y |
|---|---|
| (i) මසච්චියෝ | A වීනස්ගේ උපත |
| (ii) බොටිචෙලි | B ඇඩම් සහ ඊව් උද්‍යානයෙන් නෙරපීම |
| (iii) ලෙනාඩෝ ඩා වින්චි | C පස්වන චාල්ස් අධිරාජයා |
| (iv) මයිකලාංජලෝ | D අවසාන රාත්‍රි භෝජන සංග්‍රහය |
| (v) ටිටියන් | E අවසාන විනිශ්චය |

(1) ABDEC (2) BADEC (3) BAEDC (4) BEACD (5) CDAEB(.........)

19.

| X | Y |
|---|---|
| (i) රයින් සංයුක්ත රාජ්‍යය | A මෙටර්නික් |
| (ii) ජර්මන් සංයුක්ත රාජ්‍යය | B පළමුවන කයිසර් විලියම් |
| (iii) උතුරු ජර්මන් සංයුක්ත රාජ්‍යය | C ෆ්‍රෙඩ්රික් ඊබට් |
| (iv) ජර්මන් අධිරාජ්‍යය | D බිස්මාර්ක් |
| (v) වයිමාර් සමූහාණ්ඩුව | E නැපෝලියන් බොනපාට් |

(1) ACEDB (2) AEDBC (3) DECAB (4) EADBC (5) EDACB(.........)

20.

| X | Y |
|---|---|
| (i) නැපෝලියන් බොනපාට් | A ලේ සහ යකඩ ප්‍රතිපත්තිය |
| (ii) ඔටෝ ෆොන් බිස්මාර්ක් | B මහාද්වීපික ක්‍රමය |
| (iii) වී. අයි. ලෙනින් | C සාමකාමී සහජීවනය |
| (iv) නිකිතා කෲෂෙෆ් | D පෙරෙස්ත්‍රොයිකා හෙවත් ආර්ථික ප්‍රතිව්‍යුහකරණය |
| (v) මිහායල් ගොර්බචෙෆ් | E නව ආර්ථික ප්‍රතිපත්තිය |

(1) BAECD (2) CABDE (3) CEABD (4) DECBA (5) EDABC(.........)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නො ගැළපේ**. එය තෝරා ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21. වැඩවසම් ක්‍රමය හා එහි ලක්ෂණ**

(1) මධ්‍යකාලීන යුරෝපයේ පැවැති දේශපාලන හා සමාජ-ආර්ථික ක්‍රමයයි.
(2) රදළයෝ තමන් භුක්ති විඳි ඉඩම් වෙනුවෙන් රජතුමාට යුද්ධ අවස්ථාවල දී හමුදා සැපයූහ.
(3) ශක්තිමත් මධ්‍යම පන්තිය
(4) බණ්ඩාරගම් (ප්‍රවේණි) ක්‍රමය
(5) ප්‍රවේණිදාසභාවය (.........)

**22. එංගලන්තයේ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ වර්ධනය**

(1) 1215 දී ජෝන් රජතුමා විසින් මහාධිකාර පත්‍රයට අත්සන් තැබීම
(2) 1688 විප්ලවයෙන් රජතුමා අභිබවා පාර්ලිමේන්තුව ජයග්‍රහණය කිරීම
(3) දහඅටවන සියවසේ මුල් භාගය තුළ අගමැති ධුරය මුල්බැස ගැනීම
(4) 1832 ප්‍රතිසංස්කරණ පනතින් සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම
(5) 1911 දී සාමි මන්ත්‍රී මණ්ඩලයේ බලතල අඩු කිරීම (.........)

**23. ජාතික රාජ්‍ය**

(1) රජු වෙත බලය කේන්ද්‍රණය කරන ලද පරමාධිකාරී රාජාණ්ඩුව
(2) ශක්තිමත් ස්ථාවර හමුදාව
(3) නිශ්චිත දේශසීමා
(4) ජාතික ඒකීයභාවය ඉහළ මට්ටමක පැවතීම
(5) යුරෝපයේ ප්‍රථම ජාතික රාජ්‍යය ජර්මනියේ ආරම්භ විය. (.........)

**24. රුසියන් විප්ලවය**

(1) දේශපාලන හා ආර්ථික පීඩනය මෙන්ම සමාජ අසහනයද විප්ලවය ඇති වීමට ප්‍රධාන හේතුවකි.
(2) බටහිර බලවත් රටවල් සාර්වරයාට එරෙහිව විප්ලවවාදීන්ට ආධාර කළහ.
(3) ලිබරල් (මෙන්ෂෙවික්) විප්ලවය 1917 මාර්තු මස සිදු විය.
(4) බොල්ෂෙවික්වරු රුසියාවේ බලය අල්ලා ගත්හ.
(5) වී. අයි. ලෙනින් විසින් විප්ලවය මෙහෙයවන ලදී. (.........)

**25. ෆැසිස්ට්වාදයේ ලක්ෂණ**

(1) අන්තවාදී ජාතිවාදය
(2) අධිපතිවාදී ආණ්ඩුක්‍රමය
(3) ප්‍රජාතන්ත්‍රවාදයට කිසිම තැනක් නැති තනි පක්ෂ රජය
(4) හමුදා ශක්තිය සහ ප්‍රචණ්ඩත්වය
(5) සාමකාමී විදේශ ප්‍රතිපත්තිය (.........)

● අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A)**, **(B)**, **(C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක්** හෝ **කිහිපයක්** නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,
**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් .......................................... **1** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් .......................................... **2** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් .......................................... **3** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් .......................................... **4** ද,
**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ........ **5** ද, **වරහන තුළ** ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය. |

**26. ප්‍රති රෙපරමාදුව සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) ප්‍රති රෙපරමාදුව රෝමානු කතෝලික පල්ලියට එරෙහි ව්‍යාපාරයක් ලෙස පැන නැංගේ ය.
(B) ප්‍රති රෙපරමාදුවේ එක් වැදගත් අංගයක් වූයේ ජේසු සංගමයයි.
(C) 1479 දී අධර්ම මර්දනාධිකරණය ස්පාඤ්ඤයේ පිහිටුවනු ලැබී ය
(D) ට්‍රෙන්ට් සම්මේලනය මගින් ප්‍රොතෙස්තාන්ත දහම නිර්වචනය කොට පැහැදිලි ලෙස ඉදිරිපත් කරන ලදී. (.........)

**27. කාර්මික විප්ලය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) කෘෂිකාර්මික ආර්ථිකයක සිට කර්මාන්තශාලාවල යන්ත්‍ර සූත්‍ර භාවිතයෙන් කෙරෙන නිෂ්පාදනය මුල්කරගත් නාගරික ආර්ථිකයක් කරා ඇති වූ පරිවර්තනය කාර්මික විප්ලවය නමින් හැඳින් වේ.
(B) කාර්මික විප්ලවයෙන් ඵලදායීතාව හා ආර්ථික වර්ධනය වැඩි විය.
(C) කාර්මික විප්ලවය මුලින් ම ප්‍රංශයේ ආරම්භ විය.
(D) යුරෝපය තුළ මුළුමනින් ම කාර්මීකරණයට භාජනය වූ මුල් ම රට පෘතුගාලයයි. (.........)

**28. නැපෝලියන් බොනපාට් සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) නැපෝලියන් බොනපාට් ප්‍රංශ විප්ලවයෙන් බිහිවූ දරුවා ලෙස හැඳින් වේ.
(B) නැපෝලියන් බොනපාට් නයිල් සටනේ දී එංගලන්තය පරාජයට පත් කළේ ය.
(C) නැපෝලියන් බොනපාට් 1804 දී ප්‍රංශ අධිරාජයා ලෙස කිරුළු පැළඳී ය.
(D) නැපෝලියන් බොනපාට් කැල්වින් දහම නිල රාජ්‍ය ආගම ලෙස පිළිගත්තේ ය. (.........)

**29. ජර්මනිය එක්සත් කිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) ජර්මනිය ඔස්ට්‍රියාවේ නායකත්වය යටතේ එක්සත් කරන ලදී.
(B) කාබොනාරි ව්‍යාපාරයේ සාමාජිකයෝ අවස්ථා කිපයකදී ම ජර්මනිය එක්සත් කිරීමට උත්සාහ කළහ.
(C) ෂ්ලේස්විග් හා හෝල්ස්ටයින් මුල්කරගෙන 1864 ඇති වූ යුද්ධයේ දී ඔස්ට්‍රියාව සහ ප්‍රශියාව විසින් ඩෙන්මාර්කය පරාජයට පත් කරන ලදී.
(D) ප්‍රංශ-ප්‍රශියන් යුද්ධය ජර්මනිය එක්සත් කිරීම සම්පූර්ණ කළේ ය. (.........)

**30. නව අධිරාජ්‍යවාදය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) කාර්මික විප්ලවය, නව අධිරාජ්‍යවාදය ඇති වීමට මග පෑදී ය.
(B) අමුද්‍රව්‍ය හා වෙළෙඳපොළ සඳහා යුරෝපා බලවතුන් අතර ඇති වූ උග්‍ර තරගය හේතුකොට ගෙන නව අධිරාජ්‍යවාදය බිහි විය.
(C) නව අධිරාජ්‍යවාදයේ ප්‍රතිඵලයක් ලෙස අප්‍රිකා මහද්වීපය යුරෝපා බලවතුන් අතර කැබලි වී ගියේ ය.
(D) පළමුවන ලෝක යුද්ධය ඇති වීමට තුඩු දුන් එක් සාධකයක් වූයේ නව අධිරාජ්‍යවාදයයි. (.........)

● අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31.** පළමුවන රෝම අධිරාජයා ලෙස සැලකෙන්නේ කවු ද?
(1) මහා ඇලෙක්සැන්ඩර් (2) ජුලියස් සීසර් (3) ඔගස්ටස්
(4) ක්ලෝඩියස් (5) මාකස් අවුරේලියස් (.........)

**32.** 1649 දී ප්‍රසිද්ධියේ මරණයට පත් කරන ලද එංගලන්තයේ රජතුමා කවු ද?
(1) පළමුවන ජේම්ස් (2) පළමුවන චාල්ස් (3) දෙවන චාල්ස්
(4) දෙවන ජේම්ස් (5) තුන්වන විලියම් (.........)

**33.** බලතල වෙන් කිරීම පිළිබඳ න්‍යාය ඉදිරිපත් කළේ කවු ද?
(1) ජීන් බොඩෑන් (2) තොමස් හොබ්ස් (3) වෝල්ටෙයාර්
(4) මොන්ටෙස්කියු (5) රූසෝ (.........)

**34.** 'යුද්ධය හා සාමය' (War and Peace) නම් කෘතියේ කතුවරයා කවු ද?
(1) ඉවාන් තුර්ගිනිව් (2) ෆියෝදෝර් ඩොස්ටොයෙව්ස්කි (3) ලියෝ ටොල්ස්ටෝයි
(4) හෙන්රික් ඉබ්සන් (5) මැක්සිම් ගෝර්කි (.........)

**35.** ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුවේ ප්‍රථම චාන්සලර්වරයා කවු ද?
(1) කොන්රඩ් ඇඩිනුවර් (2) විලී බ්‍රාන්ට් (3) කුට් කිසිංගර්
(4) හෙල්මුට් ෂ්මිට් (5) එරික් හොනෙකර් (.........)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන් තුළ** ලියන්න.

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** | |
|---|---|---|---|
| **36.** | ග්‍රීක-පර්සියානු යුද්ධය මුල්කරගෙන සිය 'ඉතිහාසය' නම් කෘතිය රචනා කළ හෙරඩෝටස් 'ඉතිහාසයේ පියා' ලෙස හඳුන්වනු ලැබේ. | ග්‍රීකයන් අතර ඉතිහාසය නම් විෂය ක්ෂේත්‍රය නිර්මාණය කළ හෙරඩෝටස් ඇතැම් අවස්ථාවලදී සිය මූලාශ්‍රය විවේචනාත්මක ලෙස පරීක්ෂා කරමින් පර්සියානු යුද්ධවල දී සත්‍ය වශයෙන් ම සිදු වූයේ කුමක්දැ'යි සෙවීමට උත්සාහ කළේ ය. | (.........) |
| **37.** | පෙට්රාක් 'මානවවාදයේ පියා' ලෙස හඳුන්වනු ලැබේ. | වෙස්ට්ෆේලියා ගිවිසුමෙන් තිස් අවුරුදු යුද්ධය අවසන් විය. | (.........) |
| **38.** | 1498 දී කැලිකට්හි ගොඩ බට වස්කෝ ද ගාමා 'අපි කුළුබඩු හා ක්‍රිස්තියානීන් සොයාගෙන පෙරදිගට පැමිණියෙමු' යනුවෙන් ප්‍රකාශ කළේ ය. | වස්කෝ ද ගාමා ලොව වටා යාත්‍රා කළ පළමු නාවිකයා ලෙස හඳුන්වනු ලැබේ. | (.........) |
| **39.** | මෙටර්නික්ගේ නායකත්වය යටතේ ෆ්‍රෑන්ක්ෆර්ට් පාර්ලිමේන්තුව පවත්වනු ලැබී ය. | ජර්මනිය දේශපාලන වශයෙන් එක්සත් කිරීමට අවශ්‍ය ආර්ථික පදනම සොල්වරීනය විසින් සපයනු ලැබී ය. | (.........) |
| **40.** | ප්‍රංශ ජනාධිපති ඩි ගොල් යුරෝපා සංගමයට ඇතුළු වීම සඳහා බ්‍රිතාන්‍යයට ආධාර කළේ ය. | මිහායල් ගොර්බචෙෆ් යටතේ රුසියාව යුරෝපා සංගමයේ සාමාජිකයකු බවට පත් විය. | (.........) |

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

යුරෝපා ඉතිහාසය II (II කොටස)
ஐரோப்பிய வரலாறு II (பகுதி II)
History of Europe II (Part II)

25 B | S | II

**යුරෝපා ඉතිහාසය - ග්‍රීක-රෝම අවධියේ සිට ක්‍රි.ව. 1989 දක්වා**

**උපදෙස්:**
* **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **B** හා **C** කොටස්වලින් අවම වශයෙන් **එක** ප්‍රශ්නය බැගින් තෝරාගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **යුරෝපයේ දළ සිතියමක්** සපයා ඇත.)

## A කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

(i) සිසිලි (ii) රෝමය (iii) අද්‍රියාතික් මුහුද
(iv) ඩැනියුබ් ගඟ (v) පැරිස් (vi) තේම්ස් ගඟ
(vii) ජිබ්‍රෝල්ටා සමුද්‍ර සන්ධිය (viii) ඔස්ට්‍රියාව (ix) නෙදර්ලන්තය
(x) ශාන්ත පීටර්ස්බර්ග් (xi) ක්‍රිමියාව (xii) කීල් ඇළ

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගින්)*

## B කොටස

**2.** පහත දැක්වෙන ක්ෂේත්‍ර ඇසුරෙන් පුරාණ රෝම සංස්කෘතියේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න.
(i) සාහිත්‍යය (ii) ගෘහනිර්මාණ ශිල්පය (iii) ආගමික වෙනස්වීම්
(ලකුණු 16 යි)

**3.** "ප්‍රොතෙස්තාන්ත රෙපරමාදුව බහුවිධ හේතු ගණනාවකින් හටගැණිනි. ඒ අතුරෙන් ඇතැම් ඒවා සමකාලීන ආගමික, දේශපාලන හා ආර්ථික තත්ත්වය සමග කිට්ටුවෙන් බැඳී පැවතුණි."

(i) ප්‍රොතෙස්තාන්ත රෙපරමාදුව ආරම්භ වූ රට නම් කරන්න. (ලකුණු 01 යි)
(ii) ප්‍රොතෙස්තාන්ත රෙපරමාදුව ඇති වූයේ කුමන ආගමික ආයතනයකට හා එහි නායකයාට එරෙහිව ද? (ලකුණු 02 යි)
(iii) ප්‍රොතෙස්තාන්ත රෙපරමාදු ව්‍යාපාරයේ නායකයන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02 යි)
(iv) ප්‍රොතෙස්තාන්ත රෙපරමාදුව ඇති වීමට තුඩු දුන් ආගමික, දේශපාලන හා ආර්ථික හේතුවල සාපේක්ෂ වැදගත්කම විවේචනාත්මකව විමසන්න. (ලකුණු 11 යි)

**4.** (i) ප්‍රංශ විප්ලවය ඇති වීමට තුඩු දුන් ප්‍රධාන සාධක විග්‍රහ කරන්න.
(ii) ප්‍රංශ විප්ලවය, ප්‍රංශය සහ යුරෝපයේ සෙසු රටවල් කෙරෙහි ඇති කළ බලපෑම පරීක්ෂා කරන්න.
(ලකුණු 16 යි)

**5.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ග්‍රීක පෞර රාජ්‍ය
(ii) ස්පාඤ්ඤය නිරතවූ දේශ ගවේෂණ
(iii) රිචලියුගේ දේශීය හා විදේශීය ප්‍රතිපත්තිය
(iv) අමෙරිකන් නිදහස් සටන ඇතිවීමට තුඩුදුන් පසුබිම

*(එක් කෙටි සටහනකට ලකුණු **08** බැගින්)*

[අටවැනි පිටුව බලන්න.

## C කොටස

**6.** (i) වියානා සම්මේලනය විසින් ගනු ලැබූ ප්‍රධාන තීරණ විස්තර කරන්න.

(ii) වියානා සම්මුතිය නූතන යුරෝපා ඉතිහාසයේ කඩඉමක් ලෙස කෙතෙක් දුරට සැලකිය හැකි දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

**7.** "බාධක බොහොමයකට මුහුණ දුන් ඉතාලි එක්සත් ව්‍යාපාරය ජයග්‍රහණයෙන් අවසන් විය."

(i) "තරුණ ඉතාලිය" නම් සංවිධානය පිහිටුවන ලද ඉතාලි නායකයා නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) ඔහු ඉතාලියේ පිහිටුවීමට අපේක්ෂා කළේ කවර ආකාරයේ ආණ්ඩුක්‍රමයක් ද? (ලකුණු 01 යි)

(iii) ඉතාලිය එක්සත් කිරීමේ නායකත්වය ගත් රාජ්‍යය නම් කරන්න. (ලකුණු 01 යි)

(iv) 1815 සිට 1848 දක්වා ඉතාලිය එක්සත්කිරීමට එරෙහිව පැවති බාධක සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)

(v) ඉහත (iv) හි දක්වන ලද බාධක ජයගනිමින් ඉතාලිය එක්සත් කළ අයුරු පරීක්ෂා කරන්න. (ලකුණු 09 යි)

**8.** "දෙවන ලෝක යුද්ධය ඇතිවීමේ බීජ වර්සායි ගිවිසුමෙහි ගැබ්ව පැවතුණි." සාකච්ඡා කරන්න. (ලකුණු 16 යි)

**9.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) 1848 විප්ලවය

(ii) රුසියාවේ බොල්ෂෙවික් විප්ලවයේ ජයග්‍රහණය

(iii) තිරවි යුද්ධය

(iv) එක්සත් ජාතීන්ගේ සංවිධානය

*(එක් කෙටි සටහනකට ලකුණු **08** බැගින්)*

* * *

AL/2019/25B/S-II(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

NEW


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

| | | |
|---|---|---|
| යුරෝපා ඉතිහාසය II<br>ஐரோப்பிய வரலாறு II<br>History of Europe II | 25B | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 1

විභාග අංකය / சுட்டெண் / Index No. ....................................



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

නූතන ලෝක ඉතිහාසය II (I කොටස)
நவீன உலக வரலாறு II (பகுதி I)
Modern World History II (Part I)

25 C | S | II

2019.08.23 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**නූතන ලෝක ඉතිහාසය - ක්‍රි.ව. 1500 සිට 1989 දක්වා**

විභාග අංකය: ....................................

**උපදෙස්:**

* මෙම කොටස ප්‍රශ්න **40** කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
* මෙම කොටසට ලකුණු **40** ක් දෙනු ලැබේ.
* කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස, II කොටසේ** පිළිතුරු පත්‍ර සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

● අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැළපේ.** එම **නො ගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

1. (1) නයිල් (2) හ්වැංහෝ (3) ඇමසන් (4) මිසිසිපි (5) කීල් (......)

2. (1) කියොතෝ (2) ඔසාකා (3) මකාඕ (4) නගෝයා (5) තෝකියෝ (......)

3. (1) ජිඕටෝ (2) මසච්යෝ (3) බොටිචෙලි (4) මකියාවෙලී (5) මයිකලාංජලෝ (......)

4. (1) ජෝන් හස් (2) මාටින් ලූතර් (3) උල්රිච් ස්විංලි (4) ජෝන් කැල්වින් (5) ඉග්නේෂියස් ලොයොලා (......)

5. (1) අයිතිවාසිකම් පනත (2) මිනිස් අයිතිවාසිකම් ප්‍රකාශනය (3) සුදු ඕස්ට්‍රේලියානු ප්‍රතිපත්තිය (4) මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (5) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර අභිසම්මුතිය (......)

6. (1) ඊජිප්තුව (2) සුඩානය (3) නයිජීරියාව (4) කෙන්යාව (5) ඉස්රායලය (......)

7. (1) බ්‍රිතාන්‍ය පොදුරාජ්‍ය මණ්ඩලය
(2) ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO)
(3) අග්නිදිග ආසියාතික ගිවිසුම් සංවිධානය (SEATO)
(4) මධ්‍යම ගිවිසුම් සංවිධානය (CENTO)
(5) අග්නිදිග ආසියාතික ජාතීන්ගේ සංගමය (ASEAN) (......)

[දෙවැනි පිටුව බලන්න.

8. (1) නේපාලය (2) තමිල්නාඩු (3) කර්ණාටක
(4) ආන්ද්‍රා ප්‍රදේශ් (5) මහාරාෂ්ට්‍ර (......)

9. (1) කයිරෝ සම්මේලනය (2) බර්ලින් සම්මේලනය (3) ටෙහෙරාන් සම්මේලනය
(4) යාල්ටා සම්මේලනය (5) පොට්ස්ඩාම් සම්මේලනය (......)

10. (1) මහත්මා ගාන්ධි (2) රාජේන්ද්‍ර ප්‍රසාද් (3) සර්වපල්ලි රාධක්‍රිෂ්ණන්
(4) නීලම් සන්ජීව රෙඩ්ඩි (5) රාමස්වාමි වෙන්කතරාමන් (......)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එක්** යුගලයක පද එකිනෙකට **නො ගැළපේ**. එම **නො ගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

11. (1) බූර්බන් - ප්‍රංශය
(2) රොමනොෆ් - ප්‍රශියාව
(3) මිං - චීනය
(4) කොන්බවුං - බුරුමය
(5) හැනෝවර් - එංගලන්තය (......)

12. (1) ගෝව - පෘතුගීසි
(2) මැනීලා - ස්පාඤ්ඤ
(3) බතාවියා - ලන්දේසි
(4) කල්කටා - ඉංග්‍රීසි
(5) ජකර්තා - ප්‍රංශ (......)

13. (1) කර්ණාටක යුද්ධ - එංගලන්තය හා නෙදර්ලන්තය
(2) හත් අවුරුදු යුද්ධය - එංගලන්තය හා ප්‍රංශය
(3) අබිං යුද්ධය - එංගලන්තය හා චීනය
(4) ක්‍රිමියන් යුද්ධය - රුසියාව හා තුර්කිය
(5) සත් සති යුද්ධය - ඔස්ට්‍රියාව හා ප්‍රශියාව (......)

14. (1) භීම සමය - ප්‍රංශ විප්ලවය
(2) මොන්රෝ න්‍යාය - යුරෝපා රටවල් අමෙරිකා මහාද්වීපයේ කටයුතුවලට මැදිහත්වීමට එරෙහිව අමෙරිකා එක්සත් ජනපදය කළ ප්‍රකාශනය
(3) ජර්මනිය එක්සත් කිරීමට ගත් ප්‍රයත්නය - ෆ්‍රැන්ක්ෆර්ට් සම්මේලනය
(4) ස්වයං නීර්ණ මූලධර්මය - වර්සායි සාම සමථය
(5) නව ආර්ථික ප්‍රතිපත්තිය - ස්වයං ශක්තිමත්වීමේ චීන ප්‍රතිපත්තිය (......)

15. (1) ඕර්ලැන්ඩෝ - ඉතාලිය
(2) ලොයිඩ් ජෝර්ජ් - බ්‍රිතාන්‍යය
(3) හින්ඩෙන්බර්ග් - ඔස්ට්‍රියාව
(4) ක්ලෙමන්සෝ - ප්‍රංශය
(5) වුඩ්රෝ විල්සන් - අමෙරිකා එක්සත් ජනපදය (......)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරවල දී ඇත. **Y** තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නො වේ**. **Y** තීරය, **X** තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

16.

| | X | | Y |
|---|---|---|---|
| (i) | ක්‍රෙම්ලින් | A | නිව්යෝර්ක් |
| (ii) | ශාන්ත පීටර් දෙව්මැදුර | B | ලන්ඩන් |
| (iii) | නොත්‍රු දාම් දෙව්මැදුර | C | රෝමය |
| (iv) | වෙස්ට්මිනිස්ටර් මාලිගය | D | පැරිස් |
| (v) | නිදහස් ප්‍රතිමාව | E | මොස්කව් |

(1) ADCBE (2) BADCE (3) CDAEB (4) ECDBA (5) EDACB (......)

17.

| X | Y |
|---|---|
| (i) ජීන් ජැක් රූසෝ | A මිනිස් අයිතිවාසිකම් (The Rights of Man) |
| (ii) තොමස් පේන් | B දාස් කපිතාල් (Das Kapital) |
| (iii) කාල් මාක්ස් | C අසිරිමත් ඉන්දියාව (The Wonder that was India) |
| (iv) රබීන්ද්‍රනාත් තාගෝර් | D සමාජ සම්මුතිය (Social Contract) |
| (v) ඒ.එල්. බෂාම් | E ගෝරා |

(1) DABEC (2) DACBE (3) DEACB (4) ECDAB (5) EDBCA (……)

18.

| X | Y |
|---|---|
| (i) වී.අයි. ලෙනින් | A තනි රටේ සමාජවාදය |
| (ii) ලියොන් ට්‍රොට්ස්කි | B නිර්ධන පන්තියේ අඥාදායකත්වය |
| (iii) ජෝශප් ස්ටාලින් | C නොනවතින විප්ලවය |
| (iv) නිකිතා කෘෂෙෆ් | D ග්ලස්නොස්ට් හා පෙරෙස්ත්‍රොයිකා |
| (v) මිහායල් ගොර්බචෙෆ් | E සාමකාමී සහජීවනය |

(1) ACEBD (2) BCAED (3) BEDCA (4) BEACD (5) DEACB (……)

19.

| X | Y |
|---|---|
| (i) ජාතීන්ගේ සංගමය | A පැරීසිය |
| (ii) එක්සත් ජාතීන්ගේ සංවිධානය (UNO) | B හේග් |
| (iii) ජාත්‍යන්තර අධිකරණය (ICJ) | C ජිනීවා |
| (iv) එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (UNESCO) | D වොෂිංටන් |
| (v) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) | E නිව්යෝර්ක් |

(1) ABDEC (2) CEABD (3) CEBAD (4) DAEBC (5) ECADB (……)

20.

| X | Y |
|---|---|
| (i) මාර්ෂල් ටිටෝ | A ඊජිප්තුව |
| (ii) ෆිඩෙල් කස්ත්‍රෝ | B කොංගෝ |
| (iii) අබ්දුල් නසර් | C කියුබා |
| (iv) පැට්‍රිස් ලුමුම්බා | D උතුරු වියට්නාමය |
| (v) හෝ චි මින්හ් | E යුගෝස්ලාවියා |

(1) ACBED (2) BDAEC (3) CADBE (4) ECABD (5) EDABC (……)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නො ගැළපේ**. එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

21. **වැඩවසම් ක්‍රමයේ පරිහානිය**
    (1) රදළ ප්‍රභූපන්තිය ශක්තිමත්වීම
    (2) වෙළඳාම පුළුල්වීම
    (3) මුදල් භාවිතය පැතිර යාම
    (4) මධ්‍යම පන්තියක් නැගී ඒම
    (5) නගර බිහිවීම (……)

22. **ජාතික රාජ්‍ය**
    (1) ශක්තිමත් මධ්‍යම ආණ්ඩුව
    (2) ශක්තිමත් ස්ථාවර හමුදාව
    (3) ජාතික එක්සත්භාවය
    (4) නිශ්චිත දේශ සීමා
    (5) පහළොස්වන සියවසේදී ඉතාමත් සංවර්ධිත ජාතික රාජ්‍යයක් ඉතාලියේ පැවතුණි. (……)

23. **ප්‍රංශ විප්ලවය ඇතිවීමට තුඩු දුන් හේතු**
    (1) ප්‍රංශය තිස් අවුරුදු යුද්ධයට සහභාගිවීම
    (2) අසමානතා පදනම් කරගත් අර්ධ වැඩවසම් සමාජ ව්‍යුහය
    (3) ගොවි ජනතාව මත පැට වී තිබූ බදු බර
    (4) අකාර්යක්ෂම පරිපාලනය සහ මූල්‍ය අර්බුදය
    (5) අමෙරිකානු විප්ලවයේ බලපෑම (……)

**24.** **ඉන්දියාවේ ජාතික ව්‍යාපාරය**

(1) 1857-58 බ්‍රිතාන්‍ය විරෝධී ජනතා නැගී සිටීම
(2) බ්‍රිතාන්‍යයන් විසින් බුරුමය ජයගැනීම
(3) ඉන්දියානු ජාතික සංගමය පිහිටුවීම
(4) සහයෝගිතා වර්ජන හා ස්වදේශී ව්‍යාපාර
(5) මහත්මා ගාන්ධිගේ නායකත්වය (……)

**25.** **දෙවන ලෝක යුද්ධයෙන් පසු ජපානය**

(1) ඩග්ලස් මැක්ආතර් සෙනෙවියා විසින් මෙහෙයවන ලද මිත්‍ර පාක්ෂික හමුදා 1945 දී ජපානය යටත් කළේ ය.
(2) 1947 දී නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වා දෙන ලදී.
(3) මුට්සුහිතෝ ජපානයේ අධිරාජයා ලෙස පත් කරන ලදී.
(4) අධිරාජයා ව්‍යවස්ථානුකූල පාලකයෙකු බවට පත් විය.
(5) ද්වි මණ්ඩල ව්‍යවස්ථාදායකයක් ස්ථාපිත කරන ලදී. (……)

● අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A)**, **(B)**, **(C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක්** හෝ **කිහිපයක්** හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ………………………………………… **1** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ………………………………………… **2** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ………………………………………… **3** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ………………………………………… **4** ද,
**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් …………… **5** ද **වරහන තුළ** ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදිය. |

**26.** **ලන්දේසි පෙරදිග යටත්විජිත අධිරාජ්‍යය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?**

(A) ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම විසින් පෙරදිග ලන්දේසි අධිරාජ්‍යය පිහිටුවන ලදී.
(B) දෙවන ලෝක යුද්ධ සමයේ දී ජපානය විසින් ලන්දේසි පෙරදිග ඉන්දියා දූපත් යටත් කරන ලදී.
(C) ඉන්දුනීසියානු ජාතික ස්වාධීනතා අරගලය සුකර්ණෝ විසින් මෙහෙයවන ලදී.
(D) 1949 දී ඉන්දුනීසියාව සිය නිදහස දිනා ගත්තේ ය. (……)

**27.** **කාර්මික විප්ලවය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?**

(A) කෘෂිකාර්මික ආර්ථිකයක සිට නාගරික ප්‍රදේශවල කර්මාන්ත ශාලාවල යන්ත්‍රෝපකරණ මාර්ගයෙන් කරන නිෂ්පාදන මුල් කොටගත් ආර්ථිකයක් දක්වා ඇති වූ පරිවර්තනය කාර්මික විප්ලවය යන්නෙන් අදහස් කෙරේ.
(B) කාර්මික විප්ලවය ප්‍රංශයේ ආරම්භ විය.
(C) කාර්මික විප්ලවය, නව අධිරාජ්‍යවාදය ඇතිවීමට මග පෑදී ය.
(D) කාර්මික විප්ලවය, මධ්‍යම පන්තියේ නැගීම වැළැක්වී ය. (……)

**28.** **ඉතාලිය එක්සත් කිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?**

(A) පීඩ්මන්ට් - සාර්ඩිනියා රාජ්‍යයේ නායකත්වය යටතේ ඉතාලිය එක්සත් කරන ලදී.
(B) කැමිලෝ කැවුර් ඉතාලිය එක්සත් කිරීමේ ප්‍රධාන නිර්මාපකයා විය.
(C) පාප් වහන්සේගේ ආශිර්වාදය යටතේ ඉතාලිය එක්සත් කරන ලදී.
(D) මැසිනි ඉතාලියේ පළමුවන අගමැතිවරයා ලෙස පත් කරන ලදී. (……)

**29.** **ජර්මනියේ නට්සිවාදය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?**

(A) වයිමාර් සමූහාණ්ඩුවේ අසාර්ථකත්වය නට්සිවාදයේ නැගීමට තුඩු දුන් ප්‍රධාන හේතුවක් විය.
(B) හිට්ලර් නට්සි නායකයා ලෙස මතුව ආවේ ය.
(C) නට්සි පාලනය යටතේ ජර්මනිය තනි පක්ෂ රාජ්‍යයක් බවට පත් විය.
(D) නට්සි පාලකයෝ ආක්‍රමණශීලී විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කළහ. (……)

[පස්වැනි පිටුව බලන්න.

**30.** **ඝානාව සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශයක/ප්‍රකාශ නිවැරදි වේද?**
(A) ඝානාව ප්‍රංශ යටත් විජිතයක් ලෙස පැවතුණි.
(B) යුරෝපීයයන් විසින් ඝානාවට අයත් භූමි ප්‍රදේශය ගෝල්ඩ් කෝස්ට් නමින් හඳුන්වනු ලැබී ය.
(C) ඝානාව ක්වාමේ න්කෘමාගේ නායකත්වය යටතේ 1957 දී ස්වාධීන සමූහාණ්ඩුවක් බවට පත් විය.
(D) ඝානාව පොදුරාජ්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවේ. (……)

● අංක **31** සිට **35** තෙක් සෑම ප්‍රශ්නයක ම නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31.** ගුරුත්වාකර්ෂණ නියමය විධිමත්ව ඉදිරිපත් කරන ලද්දේ කවරකු විසින් ද?
(1) නිකොලස් කොපර්නිකස් (2) ජොහැන්නස් කෙප්ලර්
(3) ගැලිලියෝ ගැලිලි (4) අයිසැක් නිව්ටන්
(5) පැරසෙල්සස් (……)

**32.** එංගලන්තයේ ප්‍රථම අගමැති ලෙස සැළකෙන්නේ කවරෙක් ද?
(1) රොබට් වෝල්පෝල් (2) විලියම් පිට්
(3) රොබට් ලිවර්පූල් (4) රොබට් පීල්
(5) විලියම් හස්කිසන් (……)

**33.** ආර්ය සමාජ් නමැති ඉන්දියාවේ හින්දු ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය ආරම්භ කරන ලද්දේ කවරකු විසින් ද?
(1) රාජා රාම් මෝහන් රෝයි (2) දෙබේන්ද්‍රනාත් තාගෝර්
(3) කේෂාබ් චන්ද්‍ර සෙන් (4) දයානන්ද සරස්වතී
(5) ලාලා රජ්පත් රායි (……)

**34.** කුවෝමින්තාං හෙවත් චීනයේ ජාතික මහජන පක්ෂය පිහිටුවන ලද්දේ කවරකු විසින් ද?
(1) කාන් යු වෙයි (2) යුවාන් ෂිහ් කායි
(3) සුන් යත් සෙන් (4) ලී දෂාඕ
(5) චියාං කායි ෂෙක් (……)

**35.** මිත්‍ර පාක්ෂික හමුදාවලට ජපානය යටත් වන විට සිටි ජපන් අධිරාජයා කවරෙක් ද?
(1) යොෂිහිතෝ (2) හිරෝහිතෝ
(3) තොජෝ හිදෙකි (4) අකිහිතෝ
(5) නරුහිතෝ (……)

● අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** | |
|---|---|---|---|
| **36.** | 1688-89 ඉංග්‍රීසි විප්ලවය අවසන් වූ සැනින් පළමුවන චාල්ස් රජු මරණ දණ්ඩනයට පත් කරන ලදී. | ප්‍රංශ විප්ලව සමය තුළ 1793 වර්ෂයේ දී දහසයවන ලුවී රජතුමා ගිලටීනය මගින් මරණයට පත් කරන ලදී. | (………) |
| **37.** | සොල්වරයින් සංගමය, ජර්මනියේ දේශපාලන එක්සත්භාවයට පදනම සපයා දුන්නේ ය. | ජර්මන් එක්සත්භාවය, ප්‍රශියාවේ නායකත්වය යටතේ සාක්ෂාත් කරගනු ලැබී ය. | (………) |

| | | | |
|---|---|---|---|
| **38.** | ප්‍රංශය දහනවවන සියවසේ දෙවන භාගය තුළ ඉන්දු චීනයේ සිය බලය පිහිටුවී ය. | 1898 ස්පාඤ්ඤ-අමෙරිකානු යුද්ධය ඇති වී වැඩි කල් නොගොස් පිලිපීනය ස්වාධීන රාජ්‍යයක් බවට පත් විය. | (.........) |
| **39.** | 1868 දී ජපානයේ ටොකුගාවා ෂෝගන් පාලන ක්‍රමය පෙරළා ඇමූ මෙයිජි ප්‍රතිස්ථාපනය, නූතන ජපන් ඉතිහාසයේ වැදගත් පරිවර්තනයක් සලකුණු කරයි. | වැඩවසම් ඩයිමියෝ හා සමුරායි ක්‍රම බිඳ හෙළූ මෙයිජි ප්‍රතිස්ථාපනය ජපානයේ හමුදාමය, දේශපාලන, සමාජ හා ආර්ථික ක්ෂේත්‍රවල නවීකරණයක ප්‍රගතිය සඳහා පදනම දැමී ය. | (.........) |
| **40.** | ලී කුවාන් යූ මැලේසියාවේ ප්‍රථම අගමැතිවරයා විය. | 1962 වන තෙක්, ඇල්ජීරියාව බ්‍රිතාන්‍ය ආධිපත්‍යය යටතේ පැවතුණි. | (.........) |

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

නූතන ලෝක ඉතිහාසය II (II කොටස)
நவீன உலக வரலாறு II (பகுதி II)
Modern World History II (Part II)

25 C | S | II

**නූතන ලෝක ඉතිහාසය - ක්‍රි.ව. 1500 සිට 1989 දක්වා**

*උපදෙස්:*

* **පළමුවැනි** ප්‍රශ්නය අනිවාර්ය වේ.

* **පළමුවැනි** ප්‍රශ්නයටත් **B** හා **C** කොටස්වලින් **එක** ප්‍රශ්නය බැගින් තෝරාගෙන තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.

(**පළමුවැනි** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ලෝකයේ දළ සිතියමක්** සපයා ඇත.)

## A කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

(i) නයිල් ගඟ (ii) මධ්‍යධරණී මුහුද (iii) සිසිලිය (iv) ඉස්තාන්බුල්
(v) පෘතුගාලය (vi) ජාවා (vii) බීජිං (viii) නිව්යෝර්ක්
(ix) ඇෆ්ගනිස්තානය (x) බොම්බාය (xi) මැඩගස්කාර් (xii) පැනමා ඇළ

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි)*

## B කොටස

2. (i) පහළොස්වන හා දහසයවන සියවස්වල දී ඇති වූ යුරෝපා බල ව්‍යාප්තියට තුඩු දුන් දේශපාලන, ආර්ථික හා ආගමික සාධක විග්‍රහ කරන්න.

(ii) පෘතුගාලය **හෝ** ස්පාඤ්ඤය **හෝ** යටත් විජිත අධිරාජ්‍යයක් ගොඩනැගූ ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

3. "බ්‍රිතාන්‍යය විසින් අනුගමනය කරන ලද යටත් විජිත ප්‍රතිපත්තියේ ප්‍රතිඵලයක් වශයෙන් අමෙරිකන් නිදහස් සටන හට ගත්තේ ය."

(i) උතුරු අමෙරිකාවට ගොඩබට මුල්ම ඉංග්‍රීසි ගවේෂකයෙකු නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) උතුරු අමෙරිකාවේ ඉංග්‍රීසි ජනපද අතුරෙන් **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) ඉංග්‍රීසි ජාතිකයන් උතුරු අමෙරිකාවට සංක්‍රමණය වීමට තුඩු දුන් සාධක සැකෙවින් දක්වන්න. (ලකුණු 03 යි)

(iv) බ්‍රිතාන්‍ය යටත් විජිත ප්‍රතිපත්තිය අමෙරිකානු නිදහස් සටන ඇතිවීමට කෙතෙක් දුරට හේතු වී දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 10 යි)

4. (i) 1917 රුසියානු විප්ලවය ඇති වූ පසුබිම විග්‍රහ කරන්න.

(ii) බොල්ෂෙවික්වරුන් රුසියාවේ බලය අල්ලාගත් අයුරු ඔවුන්ගේ ජයග්‍රහණයට තුඩු දුන් සාධක කෙරෙහි අවධානය යොමු කරමින් පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

5. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) පුනරුද සමයේ කලාව හා ගෘහනිර්මාණ ශිල්පය

(ii) උත්කෘෂ්ට විප්ලවය

(iii) 1848 විප්ලව

(iv) නව අධිරාජ්‍යවාදය

(එක් කෙටි සටහනකට ලකුණු 08 බැගිනි.)

[අටවැනි පිටුව බලන්න.

මෙතැනින් කපන්න

## C කොටස

**6.** "දෙවන ලෝක යුද්ධය මෑතකාලීන ලෝක ඉතිහාසයේ සන්ධිස්ථානයක් සලකුණු කරයි." දෙවන ලෝක යුද්ධයේ ප්‍රතිඵල හා සුපිරි බලවතුන් නැගී ඒම ඇසුරෙන් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.(ලකුණු 16 යි)

**7.** "කොමියුනිස්ට් විප්ලවය චීනය තුළ කැපී පෙනෙන ආර්ථික හා සමාජ පරිවර්තනයක් ඇති කළේ ය."

(i) චීන විප්ලවය මෙහෙය වූ කොමියුනිස්ට් නායකයා නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) කොමියුනිස්ට්වරුන් සිය විරෝධයපාමින් සටන් කළ පාලන තන්ත්‍රය හා එහි නායකයා නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) කොමියුනිස්ට් ජයග්‍රහණයට තුඩු දුන් සාධක සැකෙවින් දක්වන්න. (ලකුණු 03 යි)

(iv) 1976 තෙක් චීනය සංවර්ධනය කිරීම සඳහා කොමියුනිස්ට්වරුන් විසින් අනුගමනය කරන ලද ආර්ථික සහ සමාජ ප්‍රතිපත්ති විවේචනාත්මකව විමසන්න. (ලකුණු 10 යි)

**8.** (i) "නිරවි යුද්ධය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි නිර්වචනය කොට එය ආරම්භ වූ ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 07 යි)

(ii) කියුබන් මිසයිල අර්බුදය තෙක් නිරවි යුද්ධය වර්ධනය වූ අයුරු පරීක්ෂා කරන්න. (ලකුණු 09 යි)

**9.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ඉස්රායල් රාජ්‍යයේ බිහිවීම

(ii) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අරමුණු හා ව්‍යුහය

(iii) මාර්ෂල් සැලැස්ම

(iv) සෝවියට් දේශයේ බිඳවැටීම (එක් කෙටි සටහනකට ලකුණු 08 බැගිනි.)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 1

නූතන ලෝක ඉතිහාසය II
நவீன உலக வரலாறு II
Modern World History II

25C S

විභාග අංකය / சுட்டெண் / Index No. ............................

